# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2288/15 - 2022 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2022.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/2012

**බන්ධනාගාර ආඥාපනත (54 වන අධිකාරය වූ)**

(54 වන අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ 94 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති.

**ආචාර්ය විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2022 ජූලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

රීති

1920 මාර්තු මස 19 වන දින අංක 7093 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ බන්ධනාගාර රීති තවදුරටත් පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි "වෛද්‍ය නිලධරයා සම්බන්ධයෙන් වන රීති" යන ශීර්ෂය යටතේ වන 80 වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"80. (1) දඬුවම් නියම වූ සිරකරුවකු සුවය ලැබේ යයි අපේක්ෂා කළ නොහැකි බරපතල රෝගාබාධයකින් පෙළෙන බවට වෛද්‍ය නිලධරයකු හෝ වෛද්‍ය වෘත්තිකයකු විසින් රෝග විනිශ්චය කර ඇති අවස්ථාවක, එම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය වෘත්තිකයාගේ ලිඛිත සාක්ෂි මත පදනම්ව, සෞඛ්‍ය විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන වෛද්‍ය මණ්ඩලයක් විසින් නිර්දේශ කිරීමෙන් අනතුරුව, එවැනි සිරකරුවකු විශෝධන අධීක්ෂණයට යොමු කිරීම හෝ කොන්දේසි මත මුදාහැරීම සඳහා සලකා බලනු ලැබිය හැකි ය.

(2) (අ) සිරකරුවකුගේ ජීවිතය, තවදුරටත් සිරගත කොට තැබීමෙන් අවදානමට ලක්වන බව සහ ශල්‍යකර්ම හෝ වෙනත් ප්‍රතිකාර සඳහා රජයේ රෝහලකට තාවකාලිකව රැගෙන යාමෙන් සිරකරුවාගේ තත්ත්වය යහපත් අතට හැරවිය නොහැකි බව ; හෝ



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) දඬුවම අවසන් වීමට පෙර, එළඹෙන ඉතා කෙටි කාලයක් තුළ දී ජීවිතය අවසන් වීමට තුඩුදිය හැකි මාරාන්තික රෝගයකින් පෙළෙන බවට රෝග විනිශ්චය කර ඇති අවස්ථාවක දී සහ සිරකරුවා ඉවත් කිරීමට තවමත් හැකියාවක් ඇති අවස්ථාවක දී සහ සිරකරුවා නිදහස ලදහොත් ඔහුව රැකබලා ගැනීමට හැකියාව ඇති සහ කැමැත්ත දක්වන හිත මිතුරන් සහ ඥාතීන් සිටින බව සිතීමට හේතු ඇති අවස්ථාවක; හෝ

(ඇ) තවදුරටත් සිරගතකර තැබීමෙන් සිරකරුවාගේ මානසික තත්ත්වය කෙරෙහි අහිතකර අන්දමේ බලපෑමක් ඇතිවේ යයි හෝ අවදානම් තත්ත්වයක් ඇතිවේ යයි,

වෛද්‍ය නිලධරයා හෝ වෛද්‍ය වෘත්තිකයාගේ මතය වේ නම් වෛද්‍ය නිලධාරියා හෝ වෛද්‍ය වෘත්තිකයා විසින් එම සිරකරුවාගේ විස්තර ඇතුළත් සම්පූර්ණ වෛද්‍ය වාර්තාවක් සහ 26 වන බන්ධනාගාර ආකෘතියට සාරානුකූල ව සිරකරුවා පිළිබඳ විස්තර නොපමාව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත (2) වන ඡේදය යටතේ වන වාර්තාව ලැබීමෙන් අනතුරුව, සිරකරුවා පරීක්ෂා කිරීම සඳහා සහ 30 වන බන්ධනාගාර ආකෘතියට අනුගතව වාර්තා කිරීම සඳහා වෛද්‍ය මණ්ඩලයක් පත්කර, එම වාර්තාව ඒ පිළිබඳව සිය නිර්දේශ සමග සහ එම සිරකරුවා සම්බන්ධ සියලුම ලේඛන "හදිසි" වශයෙන් ලකුණු කර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සමාව ප්‍රදානය කිරීම සඳහා සලකා බැලීම පිණිස ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයා හරහා අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ".

(2) සිරකරුවන් භාරගැනීම සහ මුදාහැරීම සම්බන්ධයෙන් වන රීති යන ශීර්ෂය යටතේ :-

(අ) 165 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"165. (1) කාන්තා සිරකරුවකුගේ දරුවකු වයස අවුරුදු පහට අඩු නම් සහ පාසල් නොයන්නේ නම්, එම දරුවා මව සමග බන්ධනාගාරයට භාර ගනු ලැබිය හැකි ය. මව සමග එම දරුවා බන්ධනාගාරයට භාරගත් විටක, දරුවා භාරගත් බවට බන්ධනාගාර ජේලර්වරයා විසින් වරෙන්තුවේ පසුපිටෙහි සහතික කර, අනුමතය සඳහා බන්ධනාගාර අධිකාරිවරයාගේ අත්සන ලබාගත යුතු ය."

(2) දරුවෙකු බන්ධනාගාරය වෙත භාරගත් විට, ජේලර්වරයා විසින් වහාම එකී කරණය පිළිබඳව බන්ධනාගාර අධිකාරිවරයා සහ වෛද්‍ය නිලධරයා වෙත වාර්තා කළ යුතු ය. දරුවා ඇතුළත් කර ගැනීමෙන් පැය විසිහතරක් ඇතුළත, වෛද්‍ය නිලධරයා විසින් දරුවා පරීක්ෂා කර, බන්ධනාගාර අධිකාරීවරයා වෙත වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) දරුවා බන්ධනාගාරයට ඇතුළත් කරගැනීමේ කාරණය පිළිබඳව බන්ධනාගාර අධිකාරිවරයා විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු අතර, නොපමාව මව සමග වාසය කිරීම මඟින් දරුවාට උපරිම යහපතක් සැලසේ ද යන්න පිළිබඳව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් බන්ධනාගාර අධිකාරිවරයා සහ වෛද්‍ය නිලධරයා සමග ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සාකච්ඡා කළ යුතු ය.

(4) දරුවා බන්ධනාගාර පරිශ්‍රය තුළ අඛණ්ඩව රැඳී සිටීම එම ඇගයීම මත රඳා පවතී.

(5) එම ඇගයීම පදනම් කර ගනිමින්, මව සමග බන්ධනාගාරය තුළ රැඳී සිටීම දරුවාගේ උපරිම යහපත සඳහා නොවන බවට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, දරුවාගේ ශාරීරික සහ මානසික පැවැත්ම උදෙසා සෑහීමට පත්විය හැකි තරමට පිළියම් යෙදිය හැකි නම් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් දරුවාගේ ඥාතීන්ගේ රැකවරණය යටතේ දරුවා තබනු ලැබිය හැකි ය.

ඥාතීන්ගේ රැකවරණය යටතේ දරුවා තැබීම මගින් දරුවාගේ උපරිම යහපත සැලසිය නොහැකි බව පෙනී යන අවස්ථාවක, දරුවා, පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(6) කාන්තා සිරකරුවන් සමග රැඳී සිටින දරුවන්ට බන්ධනාගාරය තුළ ආහාර, අධ්‍යාපනය, වෛද්‍ය පහසුකම් සහ සුදුසු විවේකය හා විනෝදාස්වාදය සලසන පහසුකම් ඇතුළුව නිසි ජීවවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක සහ සමාජ වර්ධනය සඳහා වන පහසුකම් සැලසීම සාක්ෂාත් වන බවට බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහතික විය යුතු ය.

(7) දරුවන් සඳහා ආරක්ෂිත පරිසරයක් සාක්ෂාත් කිරීම උදෙසා බන්ධනාගාර බලධරයන් විසින් ප්‍රායෝගිකව හැකිතාක් දුරට කාන්තා බන්ධනාගාර තුළ මව සහ දරුවා සඳහා විශේෂ ඒකක පවත්වාගෙන යා යුතු ය.”.

(අ) 166 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

“166. ළමයාට වයස අවුරුදු පහක් සම්පූර්ණ වනවිට, ළමයා මවගෙන් වෙන් කිරීමට යෝග්‍ය තත්ත්වයක පසුවන බවට වන වෛද්‍ය නිලධරයාගේ සහතිකයක් මත ළමයා මවගෙන් වෙන්කර තැබිය යුතු ය. ළමයා බන්ධනාගාරයෙන් බැහැරව නඩත්තු කිරීම සඳහා සතුටුදායක වැඩපිළිවෙළක් සකස් කළ හැකි ද යන්න පිළිබඳව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් නිර්ණය කරනු ලැබිය යුතු ය. එවැනි වැඩපිළිවෙළක් සකස් කළ නොහැකි නම්, ළමයා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු ය.”

(3) සිරකරුවන් වෙන් කිරීම සහ වර්ගීකරණය සම්බන්ධයෙන් වන රීති යන ශීර්ෂය යටතේ :-

(අ) 178 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :-

“178. පිරිමි සිරකරුවන් පහත කාණ්ඩවලට වෙන්කළ යුතු අතර, එම එක් එක් කාණ්ඩය, බන්ධනාගාර විධිවිධානවලින් අවසරය ලැබෙන අයුරින්, අනෙක් සියලුම කාණ්ඩවලින් වෙන්ව තබාගැනීම කළ යුතු ය. එම කාණ්ඩ නම් :-

(අ) සිවිල් සිරකරුවන්;
(ආ) නඩු විභාගය අපේක්ෂාවෙන් පසුවන හෝ පැමිණිල්ලක් විභාග කිරීමේ පොරොත්තුවෙන් රිමාන්ඩ් භාරයේ පසුවන හෝ ඇප මුදල ගෙවීම පැහැර හරින හෝ සිරකරුවන්;
(ඇ) පෙර වැරදිකරුවන් වූ සිරකරුවන්;
(ඈ) පෙර වැරදිකරුවන් නොවූ සිරකරුවන්; සහ
(ඉ) දඬුවම් කාලය අනුව සිරකරුවන්.

(ආ) 178 වන රීතියට ඉක්බිතිව ම පහත සඳහන් නව රීති ඇතුළත් කිරීමෙන් :-

“178අ. (2) මාස හයකට වඩා වැඩි සිරදඬුවම් නියම වූ සෑම සිරකරුවකු ම, ඒ සිරකරු බන්ධනාගාරයට ඇතුළත් කර ගනු ලැබූ විගස ම, බන්ධනාගාර අධිකාරිවරයා විසින් පත්කරනු ලබන සහ ඔහු විසින් සභාපතීත්වය දරනු ලබන සිරකරු ඇගයුම් කමිටුවක් විසින් ඇගයිය යුතු අතර, එම සිරකරුවා එම බන්ධනාගාරය තුළ ම හෝ වෙනත් බන්ධනාගාරයක් වෙත මාරු කළ යුතු ද යන්න නිශ්චය කිරීම සඳහා එතැන් සිට අවම වශයෙන් මාස දොළහකට වරක් එම සිරකරුවා සම්බන්ධයෙන් ඇගයීමක් කළ යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ සිරකරුවකු ඇගයීම සඳහා සිරකරු ඇගයුම් කමිටුව විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය. :-

(අ) සිරකරුවාගේ වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය;
(ආ) සිරකරුවාගේ සමාජ, වෛද්‍ය, මානසික සහ වෘත්තීමය පසුබිම;
(ඇ) සිරකරුවාගේ වරදේ ස්වභාවය, ඔහු විසින් සිදුකරන ලද වරද පිළිබඳ ඔහුගේ ආකල්පය සහ දඬුවම් සවිස්තරව;
(ඈ) සිරකරුවාට වෛද්‍ය ප්‍රතිකාර හෝ අධ්‍යාපන කටයුතු සඳහා සහාය අවශ්‍ය වන්නේ ද යන වග;
(ඉ) යම් ආකාරයක වෘත්තීය පුහුණුවක් හෝ රැකියාවක් සඳහා සිරකරුවාගේ යෝග්‍යතාවය;
(ඊ) බන්ධනාගාරය තුළ දී සිරකරුවාගේ හැසිරීම;
(උ) සිරකරුවා විසින් සිරකරුවාගේ පවුලේ බැඳීම් සම්බන්ධතා පවත්වා ගැනීම; සහ
(ඌ) වෙනත් යම් අදාළ සාධක.

“178ආ. (1) 178 වන රීතිය යටතේ වූ සිරකරුවන්ගේ වර්ගීකරණය කුමක් වුව ද, එක් එක් බන්ධනාගාරයේ ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා එක් එක් සිරකරුගේ අවදානම් තක්සේරුකරණය පහත කරුණු සැලකිල්ලට ගැනීමෙන් සිදුකළ යුතු ය :-

(අ) තමාට හානි සිදුකර ගැනීම, අනෙකුත් සිරකරුවන්ට හෝ බන්ධනාගාරය තුළ රාජකාරීවල නිරත තැනැත්තන්ට හෝ බන්ධනාගාරයට පැමිණෙන තැනැත්තන්ට හානි සිදු කිරීම (හානි සිදු කිරීමට අදාළ අවදානම) -

(i) සිරගතවීමේ දඬුවම විඳින සිරකරුවා විසින් සිදුකරන ලද වරදේ බරපතළ බව හෝ වරදවල් දෙකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට දඬුවම් විඳින සිරකරුවකු වන විටක දී, සිදු කරන ලද එවැනි යම් වරදක බරපතළ බව;

(ii) දඬුවමේ කාලසීමාව හෝ සිරකරු විසින් විඳිනු ලබන දඬුවම්;

(iii) යම් මානසික ව්‍යාකූල තත්ත්වයක් වේ නම් ඒ පිළිබඳ ඉතිහාසය;

(iv) සිරකරුවා යම් නඩු විභාගයක් හෝ දඬුවම් ලබාදීමක් හෝ තවදුරටත් වූ චෝදනා බලාපොරොත්තුව සිටින්නේ ද යන වග සහ එසේ නම් එබඳු චෝදනාවල ස්වභාවය;

(ආ) බන්ධනාගාරය තුළ යහපත් සහපැවැත්මක් සඳහා වන තර්ජනය (යහපත් සහපැවැත්මට අදාළ තර්ජනය) :-

(i) සිරකරුවාගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම පිළිබඳ ඉතිහාසය;

(ii) (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනතේ උපලේඛනවල අඩංගු යම් ද්‍රව්‍යයක් හෝ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ තුන්වන සහ හතරවන උපලේඛනවල අඩංගු මත්ද්‍රව්‍යයක් හෝ මනෝව්‍යාධික ද්‍රව්‍යයක් භාවිතය පිළිබඳ ඉතිහාසය;

(ඇ) පලා යාමට ඇති ඉඩකඩ (ආරක්ෂාව පිළිබඳ අවදානම) :-

(i) බන්ධනාගාරයේ භාරයෙන් පලා යාම හෝ පලා යාමට ගත් තැත්කිරීම් පිළිබඳ ඉතිහාසය;

(ii) සැලකිල්ලට ගත යුතු බවට බන්ධනාගාර අධිකාරිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් කරුණක්;

(ඈ) බන්ධනාගාරය මගින් දුන් නිවාඩුවක් ගත කරනු ලබන අවස්ථාවේ දී හෝ නිදහස ලැබ සිටින අවස්ථාවේදී වෙනත් බරපතළ වරදක් සිදුකිරීම (නැවත වැරදි කිරීම පිළිබඳ අවදානම); සහ

(ඉ) බාහිර පරිසරයේ ආශ්‍රිතයන් සමග එක්ව සහයෝගීතාවයෙන් ප්‍රජාව තුළ වැරදි සිදු කිරීම පිළිබඳ විමර්ශනය (අපරාධ පිළිබඳ අවදානම).".

(4) වරදකරුවකු කරනු නොලැබූ සිරකරුවන් සහ සිවිල් සිරකරුවන් සම්බන්ධ රීති යන ශීර්ෂය යටතේ :-

(අ) 190 වන රීතියේ "අවසර ලබා දෙනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට :-

"අවසර ලබා දෙනු ලැබිය හැකි ය:

එසෙ වුව ද, වරදකරුවන් කරනු නොලැබූ සිරකරුවන් හෝ සිවිල් සිරකරුවන් විසින් ඔවුන් වෙත ආහාර, ඇඳුම්, ඇඳ ඇතිරිලි සහ අනෙකුත් අවශ්‍ය දෑ සපයනු ලැබිය හැකි තැනැත්තන් තිදෙනෙකු පිළිබඳව අදාළ සිරකරුවන් බන්ධනාගාරයට ඇතුළත්වන අවස්ථාවේ දී නම් කළ හැකිය" යන වචන ආදේශ කිරීමෙන්";

(ආ) 196 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"196. (1) යම් සිවිල් සිරකරුවකු, බන්ධනාගාර අධිකාරිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් ගෙවීම මත, සාමාන්‍ය සිර කුටියක් හෝ වාට්ටුවකට වඩා අනන්‍ය කාමරයක් හෝ සිර කුටියක්, එවැනි කාමරයක් හෝ සිර කුටියක් පවතින්නේ නම්, සහ එවැනි නවාතැනක් සැපයීමට එම සිරකරුවාගේ තත්ත්වය යෝග්‍ය වන්නේ නම් ඔහු වෙනුවෙන්ම විශේෂයෙන් වෙන් කරන ලද කාමරයක හෝ කුටියක රැඳවීමට බන්ධනාගාර අධිකාරිවරයා විසින් අවසර ලබාදිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ, බන්ධනාගාර අධිකාරිවරයාගේ අවසරය ඇතිව, විශේෂයෙන් වෙන් කරන ලද කාමරයක හෝ සිර කුටියක සිටින සිවිල් සිරකරුවකුට බන්ධනාගාර අධිකාරිවරයා අනුමත කළ හැකි පරිදි තමාගේ වියදමින් එම කාමරයට හෝ සිර කුටියට අවශ්‍ය ගෘහ භාණ්ඩ සපයා ගත හැකි ය.";

(ඇ) 200 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"200. (1) මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි, වරදකරුවකු කරනු නොලැබූ සෑම සිරකරුවකුට ම හෝ සිවිල් සිරකරුවකුට ම, බන්ධනාගාරය තුළ අවශ්‍ය කටයුතු සංවිධානය කරගත හැකිනම්, සතියකට වරක් තමාගේ පවුලේ සමීපතම පාර්ශ්වයක් හෝ නම් කරන ලද තැනැත්තන්, සංඛ්‍යාව තුන නොඉක්මවන පරිදි, මිනිත්තු පහළොව නොඉක්මවන කාලයක් සඳහා වන හමුවක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, කවර හෝ තත්ත්වයක් සම්බන්ධයෙන් පවතින විශේෂ අවස්ථානුගත තත්ත්ව යටතේ බන්ධනාගාර අධිකාරිවරයාට -

(අ) මෙම රීතියේ පූර්වාසන්න විධිවිධාන යටතේ ඕනෑම සිරකරුවකුට ලබාගැනීමට හිමිකම් තිබෙන හමුවීම් වාර ගණන වැඩි කිරීමට;

(ආ) එවැනි සිරකරුවකු හමුවීම සඳහා ඔහුගේ පවුලේ හෝ වෙනත් නම් කරන ලද තැනැත්තන් තිදෙනෙකුට වඩා වැඩි කණ්ඩායමකට පැමිණීමට අවසර ලබා දීමට; සහ

(ඇ) හමුවීමට ලැබෙන කාලය මිනිත්තු පහළොවකට වඩා දීර්ඝ කිරීමට,

හැකිය.

(2) වරදකරුවකු කරනු නොලැබූ සිරකරුවකුට හෝ සිවිල් සිරකරුවකුට ඉරිදා දිනවල දී හමුවීම සඳහා තැනැත්තන් ගෙන්වා ගැනීමට කිසිදු හිමිකමක් නොවිය යුතු ය.

(3) වරදකරුවකු කරනු නොලැබූ සිරකරුවකු හෝ සිවිල් සිරකරුවකු සමග සිදුවන සෑම හමුවීමක් ම බන්ධනාගාර අධිකාරිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් වේලාවලට සහ සීමාවන්ට යටත්ව සිදුවිය යුතු ය.

(4) යම් වරදකරුවකු කරනු නොලැබූ රිමාන්ඩ් සිරකරුවකු හෝ සිවිල් සිරකරුවකු හමුවීම සම්බන්ධයෙන්, පහත සඳහන් අවස්ථානුගත තත්ත්ව යටතේ, බන්ධනාගාර අධිකාරිවරයා විසින් සීමා කිරීම් පැනවිය හැකි ය :-

(අ) එවැනි සීමා කිරීමක් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන අවස්ථාවක දී;

(ආ) අපරාධයක් වැළැක්වීම, ඒ පිළිබඳව අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම හෝ අපරාධයක් සම්බන්ධයෙන් නඩු පැවරීම කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී;

(ඇ) මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය වන අවස්ථාවක දී;

(ඈ) (25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තරුණ වරදකරුවන්ගේ පුහුණු පාසල තුළ ආරක්ෂාව හෝ මනා පැවැත්ම සහ විනය සුරක්ෂිත කිරීම සඳහා හෝ පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී;

(ඉ) සෞඛ්‍ය සහ සද්චර්යාව ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී;

(ඊ) සෙසු තැනැත්තන්ගේ කීර්ති නාමය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී;

(උ) අධිකරණයේ අධිකාරය සහ අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී;

(ඌ) යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා;

(එ) අදාළ අවස්ථානුගත තත්ත්වයන් සමග අවශ්‍ය විය හැකි වෙනත් හේතු සඳහා."; සහ

(ඇ) 211 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"211. වරදකරුවකු කරනු නොලැබූ සෑම සිරකරුවකු ම හෝ සිවිල් සිරකරුවකු ම සෑම දිනක ම දහවල් කාලයේ පැයකට වඩා අඩු නොවන කාලයක් තුළ ශාරීරික අභ්‍යාසවල යෙදීම සඳහා ඔහුගේ සිර කුටියෙන් හෝ වාට්ටුවෙන් ඉවත, බන්ධනාගාර අධිකාරවරයා විසින් අදාළ සිරකරුවාට වෙන් කරනු ලැබිය හැකි යම් ස්ථානයක රැඳී සිටිය හැකි යඃ

එසේ වුව ද, යම් සිරකරුවකුට යම් විශේෂිත අවස්ථානුගත තත්ත්වයක් යටතේ, මෙම රීතියෙන් විධිවිධාන සලසන කාලසීමාවකට වඩා වැඩි කාලසීමාවක් ශාරීරික අභ්‍යාසවල යෙදීම සඳහා ඔහුගේ සිර කුටියෙන් හෝ වාට්ටුවෙන් බැහැරව යම් ස්ථානයක සිටීමට බන්ධනාගාර අධිකාරිවරයා විසින් ඉඩ ප්‍රස්ථාව සැලසිය හැකි ය.".

(5) වරදකරුවන් කරන ලද සිරකරුවන් සේවයේ යෙදවීමේ රීතිය යන ශීර්ෂය යටතේ 221 වන රීතියට ඉක්බිතිව ම පහත සඳහන් නව රීතිය ඇතුළත් කිරීමෙන් :-

"221අ. (1) මාස දොළහකට වැඩි කාලයක් සිර දඬුවම් විඳින ලද, රැකියාවක් කිරීමට සුදුසු, වරදකරුවන් කරන ලද සිරකරුවන්ට බන්ධනාගාරයෙන් පිටත පරිශ්‍රවල රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනවල හඳුනාගත් කර්මාන්තවල රැකියාවක් කිරීමට (2) ඡේදයේ විධිවිධානවලට යටත්ව, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට බන්ධනාගාර විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟතාව ඇතිව, බලය ලබාදිය හැකි ය. :-

(2) බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින්, 178ආ වන රීතියේ අවදානම් ඇගයීම පදනම් කරගනිමින්, බන්ධනාගාරයෙන් පිටත පරිශ්‍රවල රැකියාවක් කිරීමට යෝග්‍ය වන, වරදකරුවන් කරන ලද සිරකරුවන් හඳුනාගනු ලැබිය හැකි ය.

(3) බන්ධනාගාරයෙන් පිටත පරිශ්‍රයක රැකියාවක් කරන, වරදකරුවන් කරන ලද සිරකරුවන්ට වැඩ කරන කාලය තුළ ආහාර ලබාදීම සහ අදාළ කර්මාන්ත සහ ශ්‍රමය සැපයීම සම්බන්ධයෙන් පවතින නීතිවලට අනුකූල, පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ සේවායෝජකයා සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව අතර ඇති කර ගත් ගිවිසුම අනුව, වේතනයක් ලබාදීම සිදුකළ යුතු ය.

(4) (1) වන ඡේදයේ සඳහන් රැකියාවක් කරන කාලය පෙ.ව. 8.00 සිට ප.ව. 3.30 දක්වා විය යුතු ය.

(5) එක් එක් සිරකරුවකු විසින් උපයා ගන්නා ලද වේතනය එම සිරකරුවාගේ නමින් රාජ්‍ය බැංකුවක තැන්පත් කළ යුතු ය.

(6) යම් සිරකරුවකු රැකියාවක් කරන කාලය තුළ යම් රීතියක් හෝ විධානයක් උල්ලංඝනය කරන්නේ නම්, බන්ධනාගාර අධිකාරිවරයාට ඔහුගේ සේවය අවසන් කර, බන්ධනාගාරය වෙත නැවත කැඳවිය හැකි ය.

(7) සිරකරුවා විසින් සිදුකරනු ලැබූ විෂමාචාරයේ බරපතළකම අනුව, බන්ධනාගාර අධිකාරිවරයාට එකී සිරකරුවා විසින් උපයාගෙන ඇති දණ්ඩන සමා කාලය එක් සතියකට නොඅඩු කාලයකින් අහිමි කරනු ලැබිය හැකි ය.".

(6) ආහාර, ඇඳුම් සහ ඇඳ ඇතිරිලි යන ශීර්ෂය යටතේ වන 222 වන රීතියේ (9) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(9). 165. වන රීතිය යටතේ බන්ධනාගාරයට ඇතුළත් කරන ලද ළමයින් සඳහා වෛද්‍ය නිලධරයා විසින් නිර්දේශ කරන සහ බන්ධනාගාර අධිකාරිවරයා විසින් අනුමත කරන ආහාර වේලක් ලබා දිය යුතු ය."

(7) තහනම් ද්‍රව්‍ය සම්බන්ධ රීති යන ශීර්ෂය යටතේ වන 236 වන, 237 වන සහ 238 වන රීති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"236. බන්ධනාගාර ආඥාපනතට අනුකූල නොවන ලෙසට සපයනු ලබන සියලුම භාණ්ඩ, බන්ධනාගාර නීතිවලට අනුව තහනම් භාණ්ඩ ලෙස සලකනු ලැබිය යුතු ය. බන්ධනාගාර අධිකාරිවරයාගේ අවසරයකින් තොරව, සිරකරුවකුගේ සන්තකයේ තිබී සොයාගනු ලැබිය හැකි එවැනි භාණ්ඩ හෝ යම් සිරකරුවකුගේ සන්තකයට පත්කිරීමේ අදහසින් බන්ධනාගාරයට හඳුන්වාදෙනු ලබන එවැනි භාණ්ඩ බන්ධනාගාර අධිකාරිවරයා විසින් රාජසන්තක කළ යුතු ය.

237. (1) පහත සඳහන් භාණ්ඩ, වෛද්‍ය නිර්දේශ මත හෝ බන්ධනාගාර අධිකරිවරයාගේ අවසරය යටතේ මිස, බන්ධනාගාරය වෙත භාර ගනු නොලැබිය යුතු ය :-

(i) මුදල්;
(ii) ඇඳුම්;
(iii) පිසූ හෝ නොපිසූ ආහාර;
(iv) පාන වර්ග;
(v) ලිපි;
(vi) කඩදාසි; සහ
(vii) තෙල්

(2) පහත සඳහන් ද්‍රව්‍ය බන්ධනාගාරයට භාරගැනීම හෝ බන්ධනාගාරයට හඳුන්වාදීමට අවසර ලබාදීම කරනු නොලැබිය යුතු ය.

(i) මධ්‍යසාර;
(ii) දුම්කොළ;
(iii) බුලත්;
(iv) සතුන්;
(v) අවසර නොලත් ග්‍රන්ථ;
(vi) කාඩ්පත්, දාදු කැට හෝ සූදුව සඳහා භාවිත කරනු ලබන ඕනෑම උපකරණයක්;
(vii) මෙවලම්;
(viii) පුපුරන ද්‍රව්‍ය, පිපිරෙනසුලු ආම්පන්න හෝ ගිනි අවුළන ආම්පන්න;
(ix) පුපුරන ද්‍රව්‍යයක් හෝ ගිනි අවුළන ආම්පන්නයක් නිෂ්පාදනය කිරීමේ දී භාවිත කරනු ලැබිය හැකි යම්කිසි ද්‍රව්‍යයක් හෝ ආම්පන්නයක්;
(x) පතරොම්;
(xi) යම් පිස්තෝලයක්, රිවෝල්වරයක්, රයිෆලයක්, මැෂින් තුවක්කුවක්, කෙටි දුර වෙඩි තබන තුවක්කුවක් හෝ වෙනත් යම් ආකාරයේ තුවක්කුවක්;
(xii) ආයුධ;
(xiii) යම් තැනැත්තකුට ඕනෑම වර්ගයේ ශාරීරික තුවාල හෝ හානියක් සිදුවන පීඩාකාරී ක්‍රියාවක් කිරීමට හෝ බන්ධනාගාරයෙන් පලායාම සඳහා සිරකරුවකුට ආධාර කිරීම පිණිස සකස් කරන ලද හෝ පොදුවේ භාවිත කරන හෝ නිර්මාණය කිරීම හෝ නවීකරණය කළ හෝ කළ හැකි, යම්කිසි ආම්පන්නයක් හෝ උපකරණයක්;
(xiv) ජංගම දුරකථනය, දුරකථන ඇමතුමක් ගැනීමට හෝ ලැබීමට භාවිත කළ හැකි ජංගම දුරකථන උපාංගයක් හෝ වෙනත් ආම්පන්නයක්, ජංගම දුරකථන ආරෝපකයක්;
(xv) ග්‍රාහක හඳුනාගැනීමේ මොඩියුල (SIM කාඩ්පත්);
(xvi) වෛද්‍ය නිලධරයකුගේ පූර්ව අනුමතයකින් තොර වූ වට්ටෝරුගත බෙහෙතක් වන ද්‍රව්‍යයක්;
(xvii) (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනතේ උපලේඛනවල සඳහන් ද්‍රව්‍යයක්; සිරිංජයක් හෝ ඉඳිකටුවක්; බොන්ග් (bong) ලෙස හඳුන්වන උපක්‍රමය ද ඇතුළුව දුමක්

හෝ දුමාරයක් මාර්ගයෙන් ඇද ගැනීම මගින් ද්‍රව්‍යයක් ඇතුල් කිරීම සඳහා භාවිත කරනු ලැබිය හැකි උපක්‍රමයක්; (ඖෂධ හෝ ද්‍රව්‍යයක් රත් කිරීම හෝ දහනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්)

(xviii) 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය පනතේ තුන්වන සහ හතරවන උපලේඛනවල අඩංගු මත්ද්‍රව්‍යයක් හෝ මනෝව්‍යාධික ද්‍රව්‍යයක්;

(xix) බන්ධනාගාරයේ සුරක්ෂිතභාවයට සහ ආරක්ෂාවට තර්ජනයක් ඇති කරන බවට තීරණය කරනු ලැබූ යම් ගිනිගන්නාසුලු, විබාදක හෝ විෂ ද්‍රව්‍යයක්;

(xx) තීන්ත;

(xxi) ඇසිඩ් හෝ ක්ෂාරීය ද්‍රව්‍යයක්;

(xxii) මැලියම් හෝ වෙනත් ඇලෙන ද්‍රව්‍යයක්;

(xxiii) වල් පැළෑටි නාශක ද්‍රව්‍ය, දිලීර නාශක හෝ කෘමිනාශකයක්;

(xxiv) පීඩනය යොදන විසුරුම් කැනිස්ටරයක්;

(xxv) වීඩියෝ ක්‍රීඩාවක්; පරිගණක ක්‍රීඩාවක් හෝ චිත්‍රපටයක්;

(xxvi) යම් අසභ්‍ය ප්‍රකාශනයක්;

(xxvii) ප්‍රතිරූප හසුකර ගැනීම හෝ පටිගත කර ගැනීමේ හැකියාව ඇති කැමරා හෝ වෙනත් ආම්පන්නයක්; (ඩිජිටල් හෝ සිනමා පට හෝ හඬපටයක්)

(xxviii) විරුද්ධ දිශාවන් දෙකට ම ක්‍රියාකරන රේඩියෝවක් (walkie talkie ලෙස ද හඳුන්වන);

(xxix) නියමුවා රහිත දුරස්ථ පාලක ගුවන් යානා;

(xxx) පරිගණක ජාලවලට හෝ ජාලාවලින් දත්ත හුවමාරු කිරීමට හෝ ලබා ගැනීමට හැකි වන ක්‍රමවේදයක් හෝ වෙනත් උපක්‍රමයක් අඩංගු ඕනෑම ආම්පන්නයක්;

(xxxi) ඕනෑම දත්ත ගබඩා කරන ආම්පන්නයක්;

(xxxii) වෙනත් යම් ඩිජිටල්, විද්‍යුත් හෝ විදුලි ආම්පන්නයක් හෝ උපකරණයක්; සහ

(xxxiii) ඉහත සඳහන් කිසියම් අයිතමයක් සකස් කරන අන්දම හෝ බන්ධනාගාරයෙන් පලායන අන්දම හෝ බන්ධනාගාරයේ කැරලි ගැසීම, කෝලාහලයක් හෝ වෙනත් බාධා කිරීමේ ක්‍රමයක් පිළිබඳව තැනැත්තෙක්ට උපදෙස් දීමට, ඉගැන්වීමට හෝ නැතහොත් මඟ පෙන්වීමට පාදකවන යම්කිසි රූප සටහනක්, සැලැස්මක් හෝ වෙනත් ලියවිල්ලක් හෝ ශබ්ද හෝ වීඩියෝ පටිගත කිරීමක් හෝ වෙනත් ආකාරයක යම් වෙනත් ද්‍රව්‍යයක්.".

EOG 07-0064

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.